# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல / Your No: ............ | දිනය / திகதி / Date: 2021.06.01 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකවරුන් /ප්‍රාදේශීය ලේකම්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂවරුන්,

සමෘද්ධි බැංකු / මූලස්ථාන/ සමිති කළමණාකරුවන්/සමෘද්ධි සංවර්ධන නිළධාරින් වෙත,

**<u>කොවිඩ් - 19 ව්‍යවසනකාරී තත්වය නිසා බලපෑමට ලක්වූ පවුල් වලට රු. 5000/= ක දීමනාවක් ගෙවීම.</u>**

උක්ත කරුණ යටතේ අග්‍රාමාත්‍ය ලේකම් විසින් මා වෙතද පිටපතක් සහිතව, සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිකුත් කරන ලද 2021.05.31 දිනැති චක්‍රලේඛ අංක PTF/03/2021 (i) මගින් ලබා දී ඇති උපදෙස් හා බැඳේ.

02. ඒ අනුව දැනට සමෘද්ධි සහනාධාර ලබන සියළු පවුල් සඳහා ජුනි මසට අදාලව රු. 5000/- ක දීමනාවක් ලබාදීමට අදාල උපදෙස් මත අදාල වැඩසටහන ආරම්භ කරන ලෙස උපදෙස් ලබාදෙමු.

03. දැනට සමෘද්ධි සහනාධාර පවුල් සඳහා වූ සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ බැංකුවට ලැබෙන මුදල් සඳහා පහත පරිදි ගිණුම් සටහන් තැබිය යුතුය.

| | |
|---|---|
| ජංගම ගිණුම | - හර |
| අඩු ආදායම්ලාභින් පවුල් සඳහා ගෙවිය යුතු සමාජ ප්‍රතිලාභ දීමනා ගිණුම | - බැර (කේත අංකය 4056) |

ඉන් අනතුරුව වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි හරහා සුදුසුකම් ලබන ප්‍රතිලාභින්ට පෙර අවස්ථාවලදී මුදල් ගෙවීම් කල ආකාරයට පහත පරිදි ගිණුම් සටහන් තබා මුදල් නිදහස් කරන ලෙස දන්වමි.

| | |
|---|---|
| අඩු ආදායම්ලාභින් පවුල් සඳහා ගෙවිය යුතු සමාජ ප්‍රතිලාභ දීමනා ගිණුම | - හර (කේත අංකය 4056) |
| මුදල් ගිණුම | - බැර |


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

සුවිශේෂී තත්ත්වයක් තුල ස්ථිරව වසම සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරියකු නොමැති විටක හෝ වැඩ ආවරණ නිලධාරියකු පත් කල නොමැති විටක හෝ අවශ්‍යතාවය මත ප්‍රජාමූල සංවිධාන නිලධාරීන් හරහා මුදල් ගෙවීම් කල හැකිය. ඒ සඳහා පළමුව ප්‍රජාමූල සංවිධානයේ සාමාජික නොවන නිල ගිණුමට මුදල් මාරු කල යුතුය. මෙම වැඩසටහන යටතේ අනිකුත් ප්‍රතිලාභ දීමනා ගෙවීම් කිරීමේ දී ග්‍රාමීය කමිටු සාමාජිකයන්ගේ ද සහාය ලබා ගත යුතුය.

04. මෙම වැඩසටහන සඳහා සුවිශේෂ වන පරිදි අතුරුදි මුදල් සීමා රක්ෂණය පහත පරිදි ඉහල නංවා ඇත. සමෘද්ධි බැංකුව සඳහා රුපියල් මිලියන 10 ක් ද, වසම/ ප්‍රජාමූල සංවිධානය සඳහා රුපියල් මිලියන 01 ක් ද, මුදල් සඳහා රක්ෂණය සලසා ඇත.

05. සෞඛ්‍ය හා ආරක්ෂක අංශවල උපදෙස් හා සහයෝගය මත නිවසට හෝ ආසන්නම ස්ථානයට ගොස් මුදල් ගෙවීම් කටයුතු කිරීමේදී, රාජකාරි කටයුතු වල යෙදීම සඳහා අවසර දෙමින් සමෘද්ධි බැංකු කළමණාකරු විසින් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙතද, සමෘද්ධි බැංකු පාලක මණ්ඩල ගරු සභාපති විසින් ප්‍රජාමූල සංවිධාන නිලධාරීන් වෙතද, ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති අමතමින් විධිමත් පරිදි ලිපියක් නිකුත් කල යුතුය.

06. ක්ෂේත්‍රගත නිලධාරීන්ගේ සෞඛ්‍ය රක්ෂණය සඳහා ආරක්ෂිත උපකරණ ඇතුලු අනිකුත් දෑ මිලදී ගැනීම් සිදු කර ලබාදීමට දැනටමත් උපදෙස් දී ඇත. එම කාර්යය සිදු කරන ලෙසත්, අවශ්‍ය අවස්ථාවේදී පාලක මණ්ඩල/ ප්‍රජාමූල සංවිධානයේ නිලධාරීන්ට ද ලබාදීම සිදු කල යුතුය. ජනතාවට මුදල් ගෙවීමේ දී සෞඛ්‍ය උපදෙස්වලට අනුගත වෙමින් කටයුතු කල යුතුය.

07. ඒ අනුව විධිමත් පරිදි මෙම මුදල් ජනතාව අතට පත් කර නිසි ලෙස ගිණුම් වාර්තා තබා ගැනීමට කටයුතු කරන මෙන් වැඩි දුරටත් කාරුණිකව දන්වා සිටිමි.

08. මෙම ගෙවීම් පිළිබඳ ප්‍රගති වාර්තාව චක්‍රලේඛ අංක PTF/03/2021 (i) මඟින් දී ඇති උපදෙස් අනුව සකස් කර එහි පිටපතක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ද එවීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

09. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ, තවදුරටත් අවශ්‍ය උපදෙස් ඉදිරියේ දී ලබාදෙන බව තවදුරටත් දන්වමි.



**ආර්. පී. බී. තිලකසිරි**
**අධ්‍යක්ෂ ජනරාල්**

**පිටපත් :-**

1. අග්‍රාමාත්‍ය ලේකම්. අග්‍රාමාත්‍ය කාර්යාලය - කා.දැ.ස
2. ලේකම් , සමෘද්ධි, ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයංරැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස
3. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
4. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා. දැ.ස.
6. සියළුම සභාපතිවරුන් පාලක මණ්ඩල/ විධායක කමිටු - අ. ක.ස.
7. සියළුම ප්‍රජාමූල සංවිධාන සභාපතිවරුන් - අ. ක.ස.